# ජන්තාඝරයේ භාවිතය හා වාස්තු විද්‍යාත්මක ලක්ෂණ පිළිබඳ අධ්‍යයනයක්

උල්පතගම අමිතරතන හිමි

**BUSL/Mphil/2018/001**

පුරාවිද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය

සමාජයවිද්‍යා හා තුලනාත්මක අධ්‍යයනාංශය

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය

2019 ඔක්තොම්බර්

## හැඳින්වීම.

ජන්තාඝරයේ භාවිතය හා වාස්තු විද්‍යාත්මක ලක්ෂණ පිළිබඳ සාකච්ඡා කිරීමේ දී එහි ඉතිහාසය බුදුරජාණන් වහන්සේගේ ධරමාණ යුගය දක්වා ම දිව යන බව දක්නට ලැබේ. මෙරට මිහිඳු මහරහතන් වහන්සේගේ ආගමනයත් සමඟ බුදුදහම ස්ථාපනය වීම පදනම් කොට ගෙන ආරාම ආශ්‍රිතව භික්ෂූන් වහන්සේලාගේ අවශ්‍යතා පදනම් කොටගෙන වාස්තු විද්‍යාත්මක ගොඩනැගිලි රාශියක් බිහි විය. ඒවා අතරින් කායික ස්වස්ථතාව සඳහා නිර්මාණය කරන ලද ගොඩනැගිලි විශේෂය ජන්තාඝරය නමින් හඳුන්වනු ලබයි. බුදුරජාණන් වහන්සේ හැමවිට ම මිනිසාගේ නිරෝගි බව අගය කරන ලදී. ඒ බව මෙම ගාථාවෙන් විද්‍යමාන වේ.

ආරෝග්‍ය පරමා ලාභා - සන්තුට්ඨී පරමං ධනං

විස්සාසා පරමා ඤාති - නිබ්බාණං පරමං සුඛං (ඛුද්දක නිකාය, 1960 : 30)

සියලු ලාභයන්ට වඩා නිරෝගි බව උතුම් ලාභයකි. නිරෝගි බව නැත්තහුට සම්පත්වලින් ප්‍රයෝජනයක් නොලැබිය හැකිය. බෞද්ධ ශබ්දකෝෂයෙහි ද ස්වස්ථ යන්නට අර්ථ දක්වනුයේ (සං + ස්වස්ථ) යහපත් බව, සැපවත් බව, සුඛිත බවය (බෞද්ධ ශබ්ද කෝෂය, 2007 : 1676) ඒ අනුව මෙම තොරතුරු මගින් පැහැදිළි කරනු ලබන්නේ මිනිසාගේ මානසික යහපැවැත්ම නිවැරදිව පවත්වාගෙන යන්නා සේම කායික සුවතාව ද තිබිය යුතු බවයි. භික්ෂු ජීවිතයේ නිරෝගිතාව පතා ජන්තාඝරය සුදුසු බව ජීවක වෛද්‍යවරයා බුදුරජාණන් වහන්සේට පවසනුයේ භික්ෂු ජීවිතයේ නිරෝගි බව අතිශය වැදගත් කරුණක් වන නිසාවෙනි.

ප්‍රණීත ආහාර වැළඳීමෙන් පෘෂ්ඨීමත් වන භික්ෂූන් වහන්සේලාගේ ශරීරය අභ්‍යන්තරයේ නිරායාෂයෙන් රෝගාබාධ ඇති වේ. එම තත්ත්වයන් සමනය කළ හැකි ක්‍රමවේදයක් ලෙස ජන්තාඝරය මුල් අවධියේ සිටම හඳුනාගෙන තිබේ. ඒ අනුව භික්ෂු ජීවිතයේ ඇති වත් පිළිවෙත් අතර ඉතා වැගත් වත් කොටසක් ලෙස ජන්තාඝරවත හඳුන්වාදිය හැකිය. විශේෂයෙන් මෙම ජන්තාඝර භාවිතයේ වැඩි වරප්‍රසාදය හිමිව තිබුණේ වැඩිමහලු භික්ෂූන් වහන්සේලා සඳහා ය. එහි අනුගාමිකයන් ලෙස සාමණේර හිමිවරුන් උන් වහන්සේලාට අවශ්‍ය වත් පිළිවෙත් ඉටු කළ යුතු ය.

විනය පිටකයේ චුල්ලවග්ගපාළියේ දක්වා ඇති තොරතුරු අනුව එහි වාස්තු විද්‍යාත්මක ලක්ෂණයන් උපයෝගි කොට ගෙන ශ්‍රී ලංකාවේ පාරිසරික තත්ත්වයට ගැලපෙන පරිදි ජන්තාඝර සකස් කිරීම සිදු කර තිබේ. මහාවිහාර ජන්තාඝර පොකුණ හැරෙන්නට අනෙක් සියල්ලෙහිම එක හා සමාන වාස්තු විද්‍යාත්මක ලක්ෂණයන් දැක ගත හැකි වේ. ශ්‍රී ලංකාවේ ස්ථාපනය කොට ඇති ජන්තාඝරයන්හි අවශේෂ දෙස බලන විට ඒ ඒ පළාතට ආවේණික පරිසර කළාපයන්ට උචිත පරිදි සකසා තිබේ. විශේෂයෙන් අරන්කැලේ ජන්තාඝරය, මානකන්ද ජන්තාඝරය, නාගොල්ල ජන්තාඝර, කිරලාගල ජන්තාඝරය යන ස්ථානයන්හි පිහිටුවා ඇති ජන්තාඝරයන් සඳහා බහුලව යොදාගෙන ඇත්තේ ශිලාමය කොටස් පමණි.

**පටුන** | **පිටු අංකය**


| | |
|---|---|
| ග්‍රන්ථ නාම පිටුව | |
| අපේක්ෂකයාගේ ප්‍රකාශය හා උපදේශකගේ ප්‍රකාශය | i |
| නිබන්ධ සාරාංශය | i-iii |
| පිදුම | iii-iv |
| උපකාරානුස්මෘතිය | iv-v |
| පටුන | v-ix |
| මැටි බඳුන් විශ්ලේෂණ නාමාවලිය | ix-x |
| සැලසුම් නාමාවලිය | x-xiii |
| ඡායාරූප නාමාවලිය | xiii-xxii |
| ජන්තාඝර පිළිබඳ සංක්ෂේප දත්ත සටහන | xxii-xxiii |
| සංකේත නිරූපනය | xxiii-xxv |
| හැඳින්වීම | xxv-xxvii |
| පර්යේෂණ අරමුණ, පර්යේෂණ ගැටළුව, අධ්‍යයන පසුබිම, පර්. ක්‍රමවේදය | xxvii-xxviii |


## පළමු පරිච්ඡේදය


| | |
|---|---|
| 1 හැඳින්වීම | 01-04 |
| 1.1 ජන්තාඝර පිළිබඳ සිදු වී ඇති පූර්ව පර්යේෂණ අධ්‍යයනය | 04-06 |
| 1.2 මූලාශ්‍ර අධ්‍යයනය සහ භෞතික සාධක අධ්‍යයනය | 06-07 |
| 1.3 සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යයනය | 07-17 |
| 1.4 භෞතික සාධක අධ්‍යයනය (ඓතිහාසික තොරතුරු හා කුමන වර්ගයට අයත් ආරාමයක් ද යන්න හඳුනා ගැනීම) | 17-25 |
| 1.5 ජන්තාඝර ඉතිහාසය | 25-28 |

1.6 බෞද්ධ සාහිත්‍යයේ සඳහන්වන ජන්තාඝරයේ ආරම්භය 28-34

1.7 වෙනත් ග්‍රන්ථයන්ගෙන් අනාවරණය වන තොරතුරු 34-43

## දෙවන පරිච්ඡේදය

2.2 ක්ෂේත්‍රයෙන් හමුවන ජන්තාඝර නටබුන් 43-45

2.2.1 මහා විහාරයේ ජන්තාඝර පොකුණ. 45-49

2.2.2 අභයගිරි ජන්තාඝරය. i 49-53

2.2.3 අභයගිරි ජන්තාඝරය. ii 53-54

2.2.4 අභයගිරි ජන්තාඝරය. iii 54-55

2.2.5 අභයගිරි ජන්තාඝරය. iv 55-56

2.2.6 අභයගිරි ජන්තාඝරය. v 56-57

2.2.7 අභයගිරි ජන්තාඝරය. vi 57-58

2.2.8 අභයගිරි ජන්තාඝරය. vii 58-59

2.2.9 රිටිගල ජන්තාඝරය 59-61

2.2.10 මානකන්ද ජන්තාඝරය 61-62

2.2.11 වෙහෙරබැදිගල ජන්තාඝරය (කිරලාගල) 62-64

2.2.12 හත්ථිකුච්ඡි විහාර ජන්තාඝරය 64-66

2.2.13 මිහින්තලේ ජන්තාඝරය i 66-68

2.2.14 මිහින්තලේ ජන්තාඝරය ii 68-69

2.2.15 ජේතවනාරාම විහාර ජන්තාඝරය i 69-70

2.2.16 ජේතවනාරාම විහාර ජන්තාඝරය ii 70-73

2.2.17 ජේතවනාරාම විහාර ජන්තාඝරය iii 73-75

2.2.18 ජේතවන විහාර ජන්තාඝරය vi 75-76

2.2.19 විජයාරාම ජන්තාඝරය 76-78

2.2.20 පන්කුලිය අශෝකාරාම ජන්තාඝරය 78-81

2.2.21 නාගොල්ල ජන්තාඝරය 81-83

2.2.22 පුලියන්කුලම ජන්තාඝරය 83-85

2.2.23 අරන්කැලේ ජන්තාඝරය 85-89

**තෙවන පරිච්ඡේදය**

3.1 ජන්තාඝරයේ උපයෝගිතාවය 89-94

3.2 කායික ස්වස්ථතාව හා ජන්තාඝරය 94-95

3.2.1 රෝග හා රෝග නිවාරණය 95-97

3.2.2.1 ආහාර රටාව 97-102

3.2.2.2 ඇමදීම (අවට පරිසරය පවිත්‍රතාව) 102-104

**සිව්වෙනි පරිච්ඡේදය**

4.1 මංජු ශ්‍රී භාෂිත වාස්තු විද්‍යා ලක්ෂණ 104-106

4.1.1 ජන්තාඝරයේ වාස්තු විද්‍යාත්මක ලක්ෂණ 106-112

4.1.2 ජන්තාඝරයේ නිර්මාණ ලක්ෂණ 112-123

4.1.3 සුවිශේෂතා (බාහිර නිර්මාණ ලක්ෂණ) 123-130

4.1.3.1 ජල පොකුණු 130-135

4.1.4 ජන්තාඝර භාවිතයේ නූතන පරිනාමය 135-139

4.1.4.1 ජන්තාඝරවලින් හමු වී ඇති පුරාවිද්‍යාත්මක සාධක අවශේෂ 139-155

**පස්වන පරිච්ඡේදය**

5.1 ජන්තාඝරය පිළිබඳ මතුවන ගැටළු 155-157

5.2 පොළොන්නරු යුගයේ ජන්තාඝර හමු නොවීම 157-159

5.3 භික්ෂුණීන්ගේ ජන්තාඝර සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ආරාමයන් තුළ සාධක හමු නොවීම. 159-162

5.4 සාමාන්‍ය ආරාමයන්හි භික්ෂූන් සඳහා ජන්තාඝර ඉදි නොවීම, එම ක්‍රමවේදය මහාවිහාර සඳහාම භාවිත වූවක් ද? යන කරුණු විමර්ශනය කිරීම 162-165

සමාලෝචනය 165-170

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 170-177

උපග්‍රන්ථ


ඇමුණුම් අංක 01 177-185

ඇමුණුම් අංක 02 185-191

ඇමුණුම් අංක 03 191-193

සිතියම් 193-200

සැලසුම් 200-237

ඡායාරූප 237-334